කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර - 2017

සාධාරණත්වය හා භාර නීතිය
(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **07**

ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. "...ඔවුන්ගේ නෛතික අයිතිවාසිකම් කවරක් විය හැකි වුවද, ඒවාට පටහැනිව යහපත් 'හෘද සාක්ෂියට' අනුව කටයුතු කරන ලෙස තනි පුද්ගලයන්ට නියෝග කිරීම මගින්, අයුක්ති සහගතභාවයට ප්‍රතිකර්ම කිරීම පිණිස චාන්සල්වරයා ඔහුගේ රාජකීය බලය ක්‍රියාත්මක කරනු ලැබූයේ 'හෘද සාක්ෂිය' නම් පදනම මතය".

ඉංග්‍රීසි නීතියේ සාධාරණත්වයේ ඓතිහාසික වර්ධනය සහ සාධාරණත්වයේ ආප්ත ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

02. පහත අවස්ථාවන් වලදී සාධාරණත්ව නීතිය යටතේ එලෙසම ඉටුකිරීමේ නියෝග ලබාදිය හැකිද යන්න පිළිබඳව උපදෙස් දෙන්න:

(අ) සුරත් සතු බද්ධනිවාස සංකීර්ණයෙන් වසර පහක බද්ධක් යටතේ ලබාගත් බද්ධනිවාසයක් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි නිළධාරියකු වන ජේන්කින්ස් සතු විය. එම බද්ධට අනුව 'පොදු කොටස් පිරිසිදු කිරීම, වායු සමීකරණය පිළිබඳව සොයා බැලීම, බැහැර කරන දෑ අපද්‍රව්‍ය බහාලුම් වෙත ගෙනයාම යන වගකීම් දැරීමට නේවාසික දොරටුපාලකයකු රැකියාවේ නිරත කිරීම' සුරත් කළ යුතු විය. සුරත් දොරටුපාලකයකු සැපයීමට අසමත් විය. ජේන්කින්ස් හට උපදෙස් දෙන්න.

(ආ) ජ්‍යෙෂ්ට ඉංජිනේරුවරයකු වන ජෙරල්ඩ් Solar Engineering Company (SEC) සමඟ එහි කළමණාකාර අධ්‍යක්ෂකවරයා ලෙස වසර පහක් සඳහා පත්කිරීමේ ගිවිසුමකට ඇතුළු විය. ඔහු

රාජකාරිය භාර ගැනීම සඳහා ගිය විට SEC හි සභාපතිවරයා, ඔහුට දැනුම් දුන්නේ කළමණාකාර අධ්‍යක්ෂවරයකු නොමැතිව කටයුතු සිදුකිරීමට සමාගම තීරණය කර ඇති බවයි. ජෙරල්ඩ් හට උපදෙස් දෙන්න.

(ඇ) කෙනෙත් ඔහුගේ නිවස රමිල් හට විකිණීමට ගිවිසුමකට එළඹිණ. කෙනෙත්ගේ බුන්වත්භාවය හේතුවෙන් විකිණීම අවසන් කිරීම දීර්ඝ ලෙස ප්‍රමාද විය. විකිණීමේ ක්‍රියාවලිය අවසානය කරා ළඟාවන විට කෙනෙත් හට ජීවිත අවධානම් සහිත රෝගයක් ඇති බවට රෝග විනිශ්චය කරනු ලැබූ අතර කකුලක් කපා ඉවත් කළේය. ඔහුගේ සමීප මිතුරන්ගේ හා ඥාතීන්ගේ උපකාර මත යැපුණු අතර දැන් ඔහුට නිවස හැර වෙනත් ස්ථානයකට යාමට අවශ්‍ය නොවේ. රමිල්ට උපදෙස් දෙන්න.

(ඈ) යමු ඉදිරියට පක්ෂයේ ලේඛම් වන කොලින් තුම්මුල්ල නගර සභාව සමඟ, එහි සම්මන්ත්‍රණ ශාලාවෙහි පක්ෂයෙහි වාර්ෂික සමුළුව දින දෙකක් පුරාවට පැවත් වීමට ගිවිස ගත්තේය. සාමය කඩවීම හා කෝලහලයක් ඇතිවේ යන බිය හේතුවෙන් සභාව ගිවිසුම ප්‍රතික්ෂේප කළේය. කොලින් හට උපදෙස් දෙන්න.

03. සුරේන්ගේ අන්තිම කැමති පත්‍රය තුලින් සිදුකරන ලද පහත සඳහන් දේපල පැවරීම්, වලංගු ප්‍රකාශිත භාර නිර්මාණ කරයිද යන්න පිළිබඳව භාරකරු වන අර්ජුන්ට උපදෙස් දෙන්න:

(අ) මගේ පාසලේ ක්‍රිකට් පුහුණුකරුගේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා එම මුදල භාවිතා කරනු ලැබෙතැයි යන විශ්වාසයෙන් යුතුව තිඹිරිගස්යාය මහජන බැංකු ශාඛාවේ මගේ ස්ථාවර තැන්පතුවෙන් 50% ක් ;

(ආ) පීඨයේ සියලුම පීඨාධිපතිවරුන්ගේ විශාල ප්‍රමාණයේ පින්තූර සකස් කිරීමටත් ඒවා ඉහල ප්‍රමිතියෙන් යුතු රන්වන් පැහැති රාමුවලින්, රාමු කිරීමටත් පීඨයේ කාර්යමණ්ඩල රැස්වීම් ශාලාවෙහි ඒවා තැන්පත් කිරීමට නීති පීඨයට රු. 300,000/- ක් ද ;

(ඇ) දෙහිවල පිහිටි නිවාස ඒකක විස්සකින් යුතු මාගේ බද්ධ නිවාස සංකීර්ණය මගේ දරුවන්ගේ හා ඔවුන්ගේ පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා;

(ඈ) රුපියල් මිලියන 3 ක් නුවරඑළියෙහි පිහිටි මගේ මත්පැන් සැලෙහි ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කිරීමට සහ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ අර්ජුන ඔහුගේ අභිමතයට අනුව තෝරා ගනු ලබන HIV ආසාදිත රෝගීන් 100 දෙනෙකුගේ යහපත සඳහා.

04. 'පුණ්‍යභාර සම්බන්ධයෙන් වන බොහෝමයක් නඩු කටයුතු පසුපස ඇති ප්‍රතිපත්තිමය ප්‍රශ්නය වන්නේ පුණ්‍යභාර වලට ලබාදෙනු ලබන සහනයන් ලබාගැනීමට තරම් එම අරමුණු මහජනයාට එතරම් ප්‍රයෝජනවත්ද පරීක්ෂා කිරීමයි. තවද එම ප්‍රතිපත්තිය වෙනස්වන සමාජ ආර්ථික කොන්දේසි මඟින්, අවශ්‍යයෙන්ම බලපෑමට ලක්විය යුතුය'.

ඔබ එකඟ වන්නෙහිද? ඔබගේ පිළිතුරට සහේතුක සහ තහවුරු කරන ලද තර්කයන් ඉදිරිපත් කරන්න.

05. (අ) නල්ලූර්හි උපත ලබා පසුව එහි සේවය කළ සිවා පසුගිය වසර විස්සක සිට කැනඩාවේ ජීවත් වේ. 2009 වසරේදී යුද්ධය අවසන් වූ පසු, සිවා රුපියල් මිලියන 7 ක් දේපල වෙළඳාමේ යෙදෙන ව්‍යාපාරිකයකු වන ප්‍රේමට එවූ අතර නල්ලූර්හි ගෙවත්තක් සහිත නිවසක් සිවාගේ සොහොයුරිය වන කමලාගේ නමට පවරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. නිවස මිලදී ගැනීමෙන් පසු කමලා නල්ලූර්හි නිවසෙහි ජීවත් වූවාය. කෝපායි නගරයෙහි පිහිටි තම පැරණි නිවසේ ඇති වටිනා පෞරාණික ගෘහ භාණ්ඩ ඔප දමා ඒවා නල්ලූර්හි නිවසේ තබන ලෙස සිවා කමලාට කියා සිටියේය. සිවා කමලාට එවන ලද බොහෝ විද්‍යුත් තැපැල් පණිවිඩයන්හි (e-mail) ඔහු සඳහන් කරණු ලැබුයේ කැනඩාවේ ජීවන රටාවට සහ දේශගුණයට අකමැති බවයි. 2017 අප්‍රේල් හිදී සිවා ලංකාවට පැමිණ නල්ලූර්හි නිවස තමාට නැවත පවරා දෙන ලෙසත් ඔහුගේ ගෘහ භාණ්ඩ ආපසු දෙන ලෙසත් කමලාගෙන් ඉල්ලා සිටියේය. කමලා නිවස නැවත පැවරීමට සහ ගෘහ භාණ්ඩ ආපසු දීම ප්‍රතික්ෂේප කළාය. ඇය පැවසුයේ ඒවා ඇගේ දේපල වන බවත් සිවා සතුව ඒවාට කිසිදු අයිතිවාසිකමක් නොමැති බවය.

සිවා ඔබගේ උපදෙස් බලාපොරොත්තු වේ. භාර ආඥා පනතේ ප්‍රතිපාදන මත පදනම් වෙමින් ඔහුට උපදෙස් දෙන්න.

(ආ) නුවර නීතිඥවරයකු වන මහේන්, නාවලපිටියේ ජීවත් වන වැන්දඹුවක වන තමාගේ එකම සොහොයුරිය ඔවියාගෙන් නුවර පිහිටා ඇති නිවසක් සහිත වටිනා ඉඩම මිලදී ගත්තේය. මිලදී ගැනීමට පෙර, මහේන් ඔවියාට ප්‍රකාශ කළේ ප්‍රදේශයේ මිනිසුන් ඉඩමට අනවසරයෙන් ඇතුල් වී අත්පත් කරගන්නා බවත් නගර සභාව, ඉඩම මාළු වෙළඳසැලක් සඳහා අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන බවත් ය. ඉඩම සහ නිවස මිලදී ගන්නා විට නිවසේ රථගාලේ පෞරාණික වටිනාකමින් යුතු මෝටර් රථ දෙකක් විය. එක් මෝටර් රථයක් ඔවියාගේ මියගිය ස්වාමිපුරුෂයාට අයත් වූ අතර අනෙක ඔවියාගේ ස්වාමිපුරුෂයා සමඟ මෝටර් රථ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය ඔහුගේ ව්‍යාපාර හවුල්කරු වන නාමල්ට අයත් විය. ඇගේ ස්වාමිපුරුෂයාගේ මෝටර් රථය මාර්ගයේ ධාවනය කිරීම සඳහා සුදුසු තත්ත්වයේ නොමැති බව මහේන් ඔවියාට පවසා මෝටර් රථය මිලදී ගත්තේය. මහේන් ඉඩම, නිවස සහ මෝටර්

රථය අඩුවෙන් තක්සේරු කළ වටිනාකමකට ඇයව රවටා ඇයව කැමති කරවා ගත් බව පසුව ඔවියා දැනගත්තාය. නාමල් ඔහුගේ මෝටර් රථය ගැනීමට පැමිණි විට, අතහැර දමන ලද මෝටර් රථයට දැන් අයිතිවාසිකම් කිව නොහැකි බව පවසමින් එය ඔහුට ලබාදීම මහේන් ප්‍රතික්ෂේප කළේය.

ඔවියා සහ නාමල් ඔබේ උපදෙස් පතයි. භාර ආඥා පනතේ ප්‍රතිපාදන මත පදනම් වෙමින් ඔවුන්ට උපදෙස් දෙන්න.

06. 'භාරකරු නම් ධුරය යටින් දිවෙන බැරෑරුම් මූලධර්මය වන්නේ 'අපේක්ෂිත ආකාරයෙන් කාර්යන් නිසි පරිදි ඉටු කිරීමය'. එය එසේ වුවත් ඔහුගේ අයිතිවාසිකම් ගැන කිව හැකි දෙයක් නැති තරමය'.

භාර ආඥා පනතේ ප්‍රතිපාදන සහ අදාල නඩු තීන්දු නීතිය උපයෝගි කර ගනිමින් උක්ත ප්‍රකාශය පැහැදිලි කරන්න.

07. (අ) නිහාල්ගේ පුතා වන වරුණ්ගේ අර්ථලාභය සඳහා, නිහාල් 2013 වසරේදී බණ්ඩාරවෙල පිහිටි මල්වත්ත සහ පුත්තලමේ පිහිටි පොල්වත්ත යන දේපල ද්විත්වය භාරයක් වශයෙන් මහේෂ්ට පැවරුවේය. මල්වත්ත කැබලි හතරකට බෙදා වසර දෙකක් ඇතුලත ඒවා විකුණා ලැබෙන ආදායම බැංකු ගිණුමක තැන්පත් කරන ලෙස නිහාල් මහේෂ්ගෙන් ඉල්ලා සිටියේය. 2017 හිදී උමා ඔය ව්‍යාපෘතියට එරෙහිව පැවති විරෝධතා හේතුවෙන් එම ප්‍රදේශයේ ඉඩම් මිල පහත වැටුණු අතර මහේන් මුළු ඉඩමම කැබලි වලට බෙදා වෙන් නොකරම විකිණුවේය. මහේෂ් එම ආදායම නිහාල්ගේ උපදෙස් පරිදි බැංකු ගිණුමක තැන්පත් කළේය. පොල්වත්තේ ආදායාම වරුණගේ අධ්‍යාපනය වෙනුවෙන් භාවිතා කරන ලෙස නිහාල් මහේෂ්ගෙන් ඉල්ලා සිටියේය. නමුත් භාරය පිළිබඳ කිසිදු දැනීමක් නොමැති විමල්ට, මහේෂ් පොල්වත්ත විකුණුවේය. විමල්, කමල්ට ඉඩම විකුණුවේය. විකිණීමෙන් ලද ආදායමෙන් මහේෂ් බද්ධ නිවාසයක් මිලදී ගත්තේය.

භාරය කඩකිරීමේ ස්වභාවය සහ ඔහුට ලබා ගත හැකි ප්‍රතිකර්මයන් පිළිබඳ වරුණ ඔබගේ උපදෙස් පතයි. භාර ආඥා පනතේ ප්‍රතිපාදන මත පදනම් වෙමින් වරුණට උපදෙස් දෙන්න.

(ආ) ඉහත 7(අ) හි සඳහන් දේ පහත අවස්ථාවන් යටතේ සලකා බලන්න: මල්වත්ත කැබලි වලට වෙන්කිරීමකින් තොරව විකුණමින් පැවති බව මහේෂ් වරුණව දැනුවත් කර තිබීම; මහේෂ් විසින් විමල්ට පොල්වත්ත විකිණීම, වරුණ අනුමත කළ අතර මිලදී ගැනීමේදී විමල් ගෙවන ලද මුදලින් කොටසක් පිළිගැනීම; සහ කමල් භාරය පිළිබඳව දැන සිටීම.